# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2011

## පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

# පටුන

1. හැඳින්වීම

2. පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති

2.1 2011 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

2.2 පශු සම්පත් ක්ෂේත්‍රයේ මතු අභියෝග ජය ගැනීම සඳහා යෝජිත සංවර්ධන වැඩසටහන්

3. ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය

3.1 ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන

3.2 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

3.3 වතු නිවාස වැඩසටහන

4. අමාත්‍යංශය විසින් 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් සහ ව්‍යාපෘතිවල 2011.12.31 දිනට මූල්‍යමය ප්‍රගතිය

4.1 පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති

4.2 ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති

5. අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ප්‍රගතිය

5.1 සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH)

5.2 මිල්කෝ (පුද්ගලික) සමාගම (MILCO)

5.3. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB)

5.4 සීමාසහිත ශ්‍රී ලංකා ලිබියානු කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන (පුද්ගලික) සමාගම (LANLIB)

5.5 මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම (MLE)

5.6 සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම (STMF)

5.7 වැවිලි මානව සංවර්ධන භාරය (PHDT)

# පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය

## දර්ශනය

පශු සම්පතින් ස්වයංපෝෂිත වීම සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම.

## මෙහෙවර

පශු සම්පත් සහ ග්‍රාමීය ප්‍රජා යන දෙඅංශයෙන්හි තිරසාර සංවර්ධනයක් උදෙසා පවත්නා සම්පත් උපරිම අයුරින් කළමනාකරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

## අමාත්‍යාංශයේ ඉලක්කයන්.

- පශු සම්පත් සංවර්ධනය තුලින් තිරසාර සහ සමානාත්මක ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ ගොවිපළ නිෂ්පාදකයින්ට ලබාදීම.
- දේශිය නිෂ්පාදනය සුලභ කිරීම තුලින් තරඟකාරී මිලකට එම නිෂ්පාදන පාරිභෝගික ප්‍රජාව වෙත ලබාදීම.
- වසර 2016 වන විට කිරි අවශ්‍යතාවය දේශිය නිෂ්පාදනය තුලින් ළගාකර ගැනීම.
- වසර 2016 වන විට කුකුළු නිෂ්පාදන ප්‍රමාණය දෙගුණ කිරීම.
- පසුබෑමට ලක්වු ප්‍රදේශවල ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් නගා සිටුවීම.
- මූලික පහසුකම් හා ජීවනෝපාය මාර්ග සංවර්ධනය මගින් ප්‍රජාවගේ ආදායම් වැඩි කිරීම තුලින් ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම.
- ප්‍රජා මූලික සංවිධානයන් ශක්තිමත් කිරීම තුලින් ග්‍රාමීය ප්‍රජාව බල ගැන්වීම.
- ග්‍රාමීය ප්‍රජාව ආශ්‍රිත අධ්‍යාපනික, වෘත්තිය පුහුණු, ආගමික, ක්‍රිඩා හා සංස්කෘතික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

## පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

1. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
2. මිල්කෝ (පුද්ගලික) සමාගම
3. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
4. සී/ස ලිබියානු කෘෂිකාර්මික සහ පශු සම්පත් සංවර්ධන සමාගම
5. සී/ස මහවැලි පශු සම්පත් සමාගම
6. සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම
7. වැව්ලි මානව සංවර්ධන භාරය

# 1 හැඳින්වීම

## 1.1 පසුබිම

පසුගාමී ප්‍රදේශ වල වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සහ පශු නිෂ්පාදනයන්ගෙන් රට ස්වයංපෝෂිත කිරීම දර්ශනය ලෙස සළකා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශය ස්ථාපනය කරනු ලැබ ඇත.

**1. පශු සම්පත් සංවර්ධන අංශය.**

**2. ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශය.**

යන ප්‍රධාන අංශ දෙකෙන් මෙම අමාත්‍යංශය සමන්විත වේ.

සත්ව පාලනය ශ්‍රී ලංකාවේ කෘෂි ආර්ථිකයෙහි වැදගත් මෙහෙයක් ඉටු කරන අතර එය පශු නිෂ්පාදන සැපයුම තුලින් දේශීය පරිභෝජනය සඳහා වන ඉල්ලුමෙන් කොටසක් සපුරාලන අතර මිලියන භාගයකට වැඩි සුළු පරිමාණ ගොවීන් සඳහා අදායම් මාර්ගයක් සපයා ඇත.

පශු සම්පත් අංශය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 01 ට ආසන්න දායකත්වයක් දක්වයි. කුඩා පරිමාණ ගොවීන්ගේ ගොවිපළ ආදායමෙන් සියයට 30 ත් 60 ත් අතර ප්‍රමාණයක් සත්ව පාලනය තුලින් උපයනු ලබයි. සත්ව ප්‍රෝටීන ප්‍රභවයන් ලෙස පශු නිෂ්පාදනයන් සඳහා වන ඉල්ලුම ඉහළ යාමේ නැඹුරුවක් පෙන්වයි.

කිරි පට්ටි පාලනය(කර්මාන්තය) පශු සම්පත් අංශයේ ආයෝජන සහ සංවර්ධන කාර්යයන්හි ලා පුරෝගාමී ක්ෂේත්‍රය ලෙස හඳුන්වා දී ඇත. පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශය මගින් දියත් කරනු ලැබූ සංවර්ධන වැඩසටහන් තුලින් මෙරට දේශීය කිරි නිෂ්පාදනය සියයට 35 ක ස්වයංපෝෂිත තත්ත්වයක් ළඟාකර ගැනීමට හැකියාව ලැබී ඇත. 2010 වර්ෂයේදී කිරි ලීටර් මිලියන 247 ක කිරි නිෂ්පාදනය 2011 වර්ෂයේදී ලීටර මිලියන 258.3 දක්වා සියයට 4.5 කින් වර්ධනය කර ගැනීමට හැකිවිය. එමෙන්ම 2010 වර්ෂයේදී කිරි ලීටර් මිලියන 137.66 ක කිරි එකතු කිරීම සිදුකල අතර එය 2011 වන විට ලීටර් මිලියන 143.7 දක්වා සියයට 4.3 කින් වර්ධනය කර ගැනීමට හැකිවිය.

දළ දේශිය නිෂ්පාදිතය සඳහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාව ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලබන හෙයින්, ඔවුන් ආර්ථිකයෙහි වැදගත් අංගයක් බවට පත්වී තිබේ. ග්‍රාමීය අංශයන්හි පුද්ගලයින් දළ වශයෙන් මිලියන 16 ක් පමණ ඇති බැව් ගණන් බලා ඇති අතර මිලියනයකට ආසන්න ප්‍රමාණයක් වැවිලි භෝග අංශය ආශ්‍රිතව ජීවත් වේ.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතා ප්‍රතිශතය 2007 දී 15.2 ක් වූ අතර 2010 දී එය 8.9 දක්වා අඩු වී ඇත. නාගරික, ග්‍රාමීය හා වතු යන තෙඅංශයන්හි මෙම ප්‍රතිශතය පිළිවෙළින් 6.7,15.7 හා 32 ක් වන අතර ඒවා අතර පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. 2007 දී සියයට 32 ක් වූ වතු අංශයේ දරිද්‍රතා ප්‍රතිශතය 2010 වන විට සියයට 11.4 ක් දක්වා අඩු වී ඇත.

සංවර්ධනයේ අසමතුලිත ව්‍යාප්තිය හඳුනාගත් රජය පසුගාමී ප්‍රදේශයන් සංවර්ධනය කිරිමෙහිලා ප්‍රමුඛතාවය දී ඇති අතර ඒ අනුව මෙම අමාත්‍යංශය විසින් පසුගාමී ප්‍රදේශයන්හි ජීවත් වන ජනතාවගේ, විශේෂයෙන් වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හා සංවර්ධනය කිරීම සඳහා විවිධ සංවර්ධන වැඩ සටහන් ක්‍රියාවට නංවා ඇත.

# 2 2011 වර්ෂයේ පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති

වර්තමාන රජයේ මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව වර්ෂ 2016 වන විට ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනය ඇතුළු සියලුම පශු සම්පත් නිෂ්පාදිත වලින් ස්වයංපෝෂිත විය යුතුය. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය විසින් දිවයින පුරා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

2010 වර්ෂයේ පශු සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිතව පැන නැගුන ප්‍රධාන ගැටළුව වූයේ කුකුළු මස් හා බිත්තර හිඟයයි. නැවත එවැනි තත්ත්වයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් දිනක් වයසැති කුකුළු පැටවුන් ආනයනය කර ගොවීන් අතර බෙදා හැරීමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් දියත් කිරීම, මවු කුකුළු පැටවුන් ආනයනය කර පැටවුන් නිෂ්පාදනය වැඩි කිරීම හා අනෙකුත් කුකුළු අභිජනන හා කුකුළු මස් නිෂ්පාදන ආයතන උනන්දු කරවීම වැනි ක්‍රියාමාර්ග දියත් කිරීම හේතුවෙන් 2011 වර්ෂයේදී රට තුළ කුකුළු මස් හා බිත්තර ඉල්ලුම සපුරාලීමට හැකිවී තිබේ.

2016 වන විට ශ්‍රී ලංකාව කිරි ඇතුළු සියලුම පශු සම්පත් නිෂ්පාදිත වලින් ස්වයංපෝෂිත වීමේ ඉලක්කය කරා ළඟා වීමට මනා සැලසුම්ගත වැඩපිළිවෙළක අවශ්‍යතාවය අනුව අමාත්‍යාංශය විසින් පශු සම්පත් සංවර්ධනය සඳහා වූ ප්‍රධාන සැලැස්මක් පිළියෙල කරන ලද අතර ඊට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත.

දේශිය කිරි නිෂ්පාදනය නංවාලීම සඳහා ගොවීන් උනන්දු කිරීම අරමුණු කර 2011 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මේද ප්‍රතිශතය සියයට 4.2 හා මේද නොවන ඝන ද්‍රව්‍ය ප්‍රතිශතය සියයට 8.3 අඩංගු දියර කිරි ලීටරයක අවම මිල රුපියල් 50.00 දක්වා වැඩිකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙම අමාත්‍යාංශයට අනුබද්ධිත මිල්කෝ (පුද්ගලික) සමාගම විසින් ඒ අනුව නව මිල දර්ශකයන් සකස් කර 2011.03.01 වන දින සිට නව ගෙවීම් ක්‍රමය ආරම්භ කර ඇති අතර එම මිල වැඩිවීම නිසා කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයට ව්‍යවසායකයින් ඇදී ඒමත් එමගින් සමස්ත කිරි නිෂ්පාදනය වැඩි වීමේ ප්‍රවණතාවයත් දක්නට ඇත.

## 2.1 2011 වර්ෂයේ ක්‍රියාත්මක වැඩසටහන්

### 2.1.1 කිරි ගම්මාන වැඩ සටහන

කිරි ගොවීන් සවිබල ගැන්වීම තුලින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය දියුණු කිරීම මූලික අරමුණ වන මෙම වැඩසටහන 2004 වර්ෂයේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර 2010 වර්ෂය අවසාන වන විට දිවයින පුරා කිරි ගම්මාන 811 ක් ස්ථාපිත කර ඇත. 2011 වර්ෂය අවසාන වන විට තවත් කිරි ගම්මාන 80 ක් ස්ථාපිත කර අවසන් කර ඇත. තවද මෙම වර්ෂයේ සිට කිරි ගම්මානයක එක් ප්‍රතිලාභි ගොවියකු වෙත ලබාදෙන ආධාර ප්‍රමාණය රුපියල් 35,000.00 දක්වා වැඩි කර ඇත. මෙම කිරි ගම්මාන ව්‍යාපෘතිය මඟින් කිරි නිෂ්පාදනය වැඩිවනවා පමණක් නොව, අගය වැඩි කරන ලද කිරි නිෂ්පාදන සෑදීම, කිරි අලෙවිය හා එම ගම්මානවල සමාජ,ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ද සිදුවේ.

කිරි ගම්මාන වැඩසටහන යටතේ ජීවවායු ඒකක පිහිටුවීමද සිදුකෙරේ.

**2011 වසර තුලදී ස්ථාපනය කරන ලද  කිරි ගම්මාන හා ජීව වායු ඒකක**

| පළාත | කිරි ගම්මාන | ජීව වායු ඒකක |
|---|---|---|
| මධ්‍යම | 23 | 12 |
| නැගෙනහිර | 6 | 5 |
| උතුර | 5 | 2 |
| උතුරු මැද | 8 | 8 |
| වයඹ | 7 | 5 |
| සබරගමුව | 9 | 5 |
| දකුණ | 7 | 8 |
| ඌව | 10 | 3 |
| බස්නාහිර | 5 | 6 |
| **එකතුව** | **80** | **54** |

## 2.1.2 දියර කිරි පරිභෝජනය, ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම

දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම යටතේ දිවයිනේ පළාත් නවයම ආවරණය වන පරිදි කිරි අලෙවි සැල් පිහිටුවීම සිදුකෙරේ. විශේෂයෙන් පාසල්, රෝහල් වැනි ජනාකීර්ණ ස්ථාන කිරි අලෙවි සැල් ස්ථාපිත කිරීමට තෝරාගැනීම තුලින් මහජනයා වෙත අඩු මුදලකට පෝෂ්‍යදායී නැවුම් දියර කිරි පාරිභෝජනය කිරීමේ අවස්ථාව සැළසී ඇත. 2004 වර්ෂයේ සිට 2010 දක්වා අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ කිරි අලෙවි සැල් 535 ක් ස්ථාපිත කර ඇත. 2011 වර්ෂය අවසාන වන විට තවත් කිරි අලෙවිසැල්  121 ක් ස්ථාපිත කර අවසන් කර ඇත. තවද දියර කිරි අලෙවි සැල් සඳහා අඛණ්ඩ නැවුම් කිරි සැපයුමක් පවත්වා ගැනීමට කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කිරීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී.

දේශිය හා නැවුම් කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් වන සමාජ ආකල්ප වල වෙනසක් ඇති කිරීම අරමුණු කරගත්  දැනුවත් කිරීමේ වැඩසටහන් ද පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබයි.

**2011 වසර තුලදී ස්ථාපනය කරන ලද කිරි අලෙවි සැල්**

| පළාත | කිරි අලෙවි සැල් |
|---|---|
| මධ්‍යම | - |
| නැගෙනහිර | 25 |
| උතුර | 20 |
| උතුරු මැද | - |
| වයඹ | 22 |
| සබරගමුව | 11 |
| දකුණ | 15 |
| ඌව | 11 |
| බස්නාහිර | 17 |
| **එකතුව** | **121** |

කිරි එකතු කිරීමේ ජාලය ශක්තිමත් කිරීමේ සහ දියර කිරි පරිභෝජනය කිරීම ප්‍රචලිත කිරීමේ අරමුණින් මෙම වැඩ සටහන යටතේ කිරි අලෙවි සැල් පිහිටුවීමට අමතරව අනෙකුත් සංවර්ධන කටයුතු ද සිදුකරනු ලබයි.

**අදාළ ක්‍රියාකාරකම් පහත පරිදි වේ.**

## 2.1.2.1 කිරි එකතු කිරීමේ ජාලය වැඩි දියුණු කිරීම

- සබරගමුව පළාත
  - * රුː මිලියන 0.7 ක වියදමින් කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 07 පිහිටුවීම.
  - * රුː මිලියන 0.75 ක වියදමින් ලීටර 10 ක ධාරිතාවය සහිත කිරි බහාලන බඳුන් 104ක් හා ලීටර 20 ක ධාරිතාවය සහිත කිරි බහාලන බඳුන් 50 ක් ලබා දීම.
- බස්නාහිර පළාත
  - * රුː මිලියන 0.6 ක වියදමින් කිරි දෙවීමේ යන්ත්‍ර 06 ක් බෙදා දීම.
  - * රුː මිලියන 0.07 ක වියදමින් කිරි සැකසීමේ ඒකක 07ක් පිහිටුවීම.
- උතුරු පළාත
  - * රුː මිලියන 1.74 ක වියදමින් වඩමාරච්චි නිරිත කලාපයේ සත්ව අභිජනන සමූපකාර සමිති ගොඩනැගිල්ල කරවෙඩ්ඩි හි ඉදිකිරීම

## 2.1.2.2 ගොවිපොළ යාන්ත්‍රීකරණය සඳහා ආධාර කිරීම

රුː මිලියන 1.85 ක වියදමින් තෘණ කැබලි කරන යන්ත්‍ර 32 ක් බෙදා දෙන ලදී.

- මධ්‍යම පළාත
  - * විදුලි බලයෙන් ක්‍රියා කරන තෘණ කැබලි කරන යන්ත්‍ර 07 ක් බෙදා දීම.
  - * භූමිතෙල් බලයෙන් ක්‍රියා කරන තෘණ කැබලි කරන යන්ත්‍ර 03 ක් බෙදා දීම.
- සබරගමු පළාත
  - * විදුලි බලයෙන් ක්‍රියා කරන තෘණ කැබලි කරන යන්ත්‍ර 17 ක් බෙදා දීම.
  - * භූමිතෙල් බලයෙන් ක්‍රියා කරන තෘණ කැබලි කරන යන්ත්‍ර 04 ක් බෙදා දීම.
- දකුණු පළාත
  - * විදුලි බලයෙන් ක්‍රියා කරන තෘණ කැබලි කරන යන්ත්‍ර 01 ක් බෙදා දීම.

## 2.1.2.3 තෘණ බිම් කොටස් ස්ථාපනය කිරීම සඳහා අධාර සැපයීම

- බස්නාහිර පළාත
  - * රුː මිලියන 1.625 ක වියදමින් තෘණ වගා බිම් කොටස් 100 ක් ස්ථාපනය කිරීම.

## 2.1.3 සත්ව අභිජනන ගොවිපළවල් පිහිටුවීම

උසස් ආරයේ කිරි දෙනුන්ගේ හිඟකම කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ඇති ප්‍රධාන බාධාවක් වේ. මෙම ගැටළුව මගහරවා ගැනීමේ අරමුණ ඇතිව දිවයින පුරා පෞද්ගලික අභිජනන ගොවිපළවල් පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. 2010 වර්ෂය අවසාන වන විට සත්ව අභිජනන මධ්‍යස්ථාන 387ක් පිහිටුවා ඇති අතර එමගින් අභිජනන සඳහා සුදුසු සතුන් නිකුත් කිරීම සිදුකෙරේ. 2011 වර්ෂය අවසාන වන විට තවත් පෞද්ගලික අභිජනන ගොවිපලවල් 299 ක් ස්ථාපිත කර අවසන් කර ඇත.

මීට අමතරව 2012 වර්ෂයේදී අභිජනන ගොවිපළවල භාවිතය සඳහා ලිංග නිර්ණය කරන ලද ගව ශුක්‍ර ආනයනය කර බෙදා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙමගින් කිරි නිෂ්පාදනය සඳහා සුදුසු එළ ගවයින්ගේ ප්‍රමාණය බොහෝ දුරට වැඩිවනු ඇත.

**2011 වසර තුලදී ස්ථාපනය කරන ලද සත්ව අභිජනන ගොවිපළ**

| පළාත | අභිජනන ගොවිපළ |
|---|---|
| මධ්‍යම | 49 |
| නැගෙනහිර | 27 |
| උතුර | 40 |
| උතුරු මැද | 23 |
| වයඹ | 22 |
| සබරගමුව | 20 |
| දකුණ | 19 |
| ඌව | 22 |
| බස්නාහිර | 77 |
| **එකතුව** | **299** |

## 2.1.4 උතුරු වසන්තය - මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන

උතුරු පළාතේ පශු සම්පත් ක්ෂේත්‍රය දියුණු කිරීම සඳහා විශාල විභවයක් පවතින බැවින් පශු වෛද්‍ය කාර්යාල ස්ථාපිත කිරීම සඳහා සේවා සැපයුම වැඩි දියුණු කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාල 07 ක් ඉදි කිරීම 2011 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මේ වනවිට මුසලි, පුදුකුඩුඉරිප්පු, පච්චලෙයිපල්ලි, යාපනය, වවුනියා දකුණ යන පශු වෛද්‍ය කාර්යාල ඉදි කිරීම ආරම්භ කර ඇත. 2012 වර්ෂයේදී තවත් පශු වෛද්‍ය කාර්යාල 04 ක් ඉදිකරනු ඇත. මේ අනුව උතුරු පළාතේ සෑම පශු වෛද්‍ය කොට්ඨාශයක් සඳහාම පශු වෛද්‍ය කාර්යාලයක් ස්ථාපිත වනු ඇත.

රුපියල් මිලියන 60 ක වියදමින් පශු වෛද්‍ය කාර්යාල සඳහා වාහන මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.

### 2.1.5 කිරිගවයින් ආනයනය කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රථම අදියරේදී කිරි ගවයින් 500 ක් ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කරන ලද අතර ඉතිරි ප්‍රමාණය 2012 වර්ෂයේදී ආනයනය කරනු ඇත.

### 2.1.6 2011 වර්ෂයේ ක්‍රියාත්මක වූ නව ප්‍රවණතා

#### 2.1.6.1 ජාත්‍යන්තර පශු සම්පත් ප්‍රදර්ශනය

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ගරු අමාත්‍ය ආරුමුගන් තොන්ඩමන් මැතිතුමාගේ සංකල්පයක් අනුව මහජනතාව, විශේෂයෙන් තරුණ ව්‍යවසායකින් පශු සම්පත් ක්ෂේත්‍රය කෙරෙහි ආකර්ෂණය කර ගැනීම සඳහා විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කළ යුතු බැවින් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පශු සම්පත් ප්‍රදර්ශනයක් පැවැත්වීමට තීරණය විය.

මෙහි සමාරම්භක උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජයේ කැබිනට් අමාත්‍යවරු රාශියක් ද මෙම ප්‍රදර්ශනය සඳහා සහභාගි විය. 2011 ජූලි මස 7-9 වන දින දක්වා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වූ මෙම ප්‍රදර්ශනය සඳහා ජාත්‍යන්තර සමාගම් හා දිවයිනේ සෑම පළාතක්ම නියෝජනය කරමින් ගොවීන් විශාල පිරිසක් සහභාගි විය.

තාක්ෂණයන් හා සේවාවන්ට සම්බන්ධ දෑට සමගාමීව ආර්ථික වැදගත් කමකින් යුතු කුකුළන් හා අනෙකුත් සජීව සතුන් සහිත ප්‍රදර්ශනයක් ද මෙහිදී පවත්නු ලැබීය.

#### 2.1.6.2 මඩකලපුවේ පැවති වෙළඳ ප්‍රදර්ශනය

නැගෙනහිර පළාත් සභාව විසින් සංවිධානය කරන ලදුව 2011 ඔක්තෝබර් මස 7 සිට 9 වන දින දක්වා මඩකලපුවේ පැවති වෙළඳ ප්‍රදර්ශනය සඳහා අමාත්‍යංශය සහභාගී වූ අතර එහිදී නැගෙනහිර පළාතේ සත්ත්ව පාලනයේ නියුතු ගොවීන් වෙත වැස්සි පැටවුන් 30 ක් ද මී වැස්සි පැටවුන් 10 ක් ද බෙදා දෙන ලදී.

#### 2.1.6.3 දිවිනැගුම ව්‍යාපෘතිය සඳහා දායකත්වය

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ග්‍රාමීය ආර්ථික ඒකක ශක්තිමත් කිරීමේ "දිවි නැගුම වැඩසටහන" යටතේ ගෘහාශ්‍රිත සත්ව පාලන කටයුතු නැංවීම සඳහා අමාත්‍යාංශය විසින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු හා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සමග එක්ව දායකත්වය සපයනු ලබයි. 2011 වර්ෂය තුළදී මෙම ව්‍යාපෘතිය මගින් මසක් වයසැති කිකිළි පැටවුන් 225,000 ක් බෙදා දීමට කටයුතු කර ඇත.

#### 2.1.6.4 වතු ආශ්‍රිත පොදු ගවගාල් ආරම්භ කිරීම

වතු ආශ්‍රිතව කිරි ගව පාලනයේ නියුතු ගොවීන් මුහුණ දෙන ප්‍රබල අභියෝගයන් වනුයේ පානීය ජල ප්‍රභවයන් සඳහා ගොම ඇතුළු සත්ව අපද්‍රව්‍ය මිශ්‍ර වන බවට නැගෙන චෝදනාවයි. මේ සඳහා පොදු ගවගාල් ක්‍රමය හඳුන්වා දී තිබේ. තලවකැලේ පශු වෛද්‍ය කොට්ඨාශයේ මවුන්ට්වර්නන් වතුයායේ ප්‍රතිලාභීන් 20ක් සඳහා ද, බොගවන්තලාව වෙපල්ටන් වතුයායේ තවත් ප්‍රතිලාභීන් 12 ක් සඳහාද පොදු ගවගාල් ඉදි කිරීම සිදු කරන ලදී.

### 2.1.6.5 කිරි ගව සම්පත් මධ්‍යස්ථාන ආරම්භ කිරීම.

අමාත්‍යංශ ප්‍රතිපාදන යටතේ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරනු ලැබූ අභිජනන ගොවිපලවල් හා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සේවා සපයනු ලබන පුද්ගලික අභිජනන ගොවිපළ අතුරින් තෝරාගත් කිරි ගොවිපළ 12 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කිරි ගව සම්පත් මධ්‍යස්ථාන ලෙස වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත. කිරි ගවයින් සඳහා රටතුළ ඇති ඉල්ලුම සපුරාලීම සඳහා මෙය පිටුවහලක් වී තිබේ.

## 2.2 පශු සම්පත් ක්ෂේත්‍රයේ ඉදිරි අභියෝග ජයගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉදිරි වැඩසටහන්

2012 වර්ෂයේ පහත සඳහන් පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන ඇත.

| වැඩසටහන | අනුමත ප්‍රතිපාදන (රුපියල් මිලියන) |
|---|---|
| කිරි ගම්මාන වැඩසටහන | 50.00 |
| දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම | 50.00 |
| සත්ව අභිජනන ගොවිපළවල් පිහිටුවීම | 25.00 |
| කිරි/ද්විත්ව කාර්යය එළුවන් 1000ක් ආනයනය කිරීම | 35.00 |
| උතුරු වසන්තය - මධ්‍යකාලින පශු සම්පත් සංවර්ධන වැඩසටහන | 130.00 |
| කිරිගවයින් ආනයනය කිරීම | 205.00 |
| පළාත් මට්ටමින් කිරි ශීතකිරීමේ මධ්‍යස්ථාන ඇති කිරීම | 5.00 |

ඉහත වැඩසටහන් අතරින් පහත සඳහන් වැඩසටහන් 02 ක් නව වැඩසටහන් වශයෙන් 2012 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය

### 2.2.1 ලිංග නිර්ණය කරන ලද ශුක්‍රවඩි ආනයනය කිරීම

සාමාන්‍ය කෘත්‍රිම සිංචන ක්‍රියාවලිය තුළ සියයට 50 ක පිරිමි වසු පැටවුන් බිහිවීමේ සම්භාවිතාවය නිසා ගොවීන් වෙත ඇති වන පීඩනය අවම කර වැස්සි පැටවුන් බෝකර ගැනීම තුලින් කිරි නිෂ්පාදනය වැඩි කිරීම මෙමගින් අපේක්ෂිතය.

### 2.2.2 සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන

මේ යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ පිහිටුවීම, කුඩා පරිමාණ බිත්තර රක්නාගාර පිහිටුවීම, ජංගම අලෙවිසැල් පිහිටුවිම යනාදී කාර්යයන් සිදුකිරීමට අපේක්ෂිත අතර ඒ තුලින් මහජනතාව වෙත අඩු මිල පෝෂ්‍යදායි ප්‍රෝටීන් ප්‍රභවයන් වන කුකුළු මස් හා බිත්තර සුලභ කිරීම අපේක්ෂිත වේ.

# 3 ග්‍රාමීය ප්‍රජා සංවර්ධනය

රජයේ ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රකාශය වන "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" මගින් ග්‍රාමීය හා වතු අංශයේ දරිද්‍රතාවය අඩු කිරීම කෙරෙහි ප්‍රමුඛතාවක් ලබා දී ඇත. මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව ග්‍රාමීය හා වතු අංශයේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා රජය විසින් විශාල මුදලක් ආර්ථික හා සාමාජීය යටිතල පහසුකම් සඳහා වෙන් කරනු ලැබ ඇත. මේ යටතේ ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතීන් වැවිලි මානව සංවර්ධන භාරය, සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම, පළාත් සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කරනු ලබයි.

ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අංශය යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1. **ග්‍රාමීය ප්‍රදේශ වල ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන**
2. **පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන**
3. **වතු අංශයේ නිවාස වැඩසටහන**

## 3.1 ග්‍රාමීය ප්‍රදේශවල ජීවනෝපාය හා මූලික පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ වෘත්තීය පුහුණුව තුලින් ස්වයං රැකියා සඳහා පෙළඹවීම ඇති කිරීමයි. මෙය අමාත්‍යංශය යටතේ පවතින සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. 2011 වර්ෂය සඳහා මේ යටතේ රු:මිලියන 190 ක් වෙන්කරනු ලැබ ඇත.

2011 වර්ෂයේදී මෙම වැඩසටහන යටතේ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

### 3.1.1 ප්‍රජා ශක්ති හා නව ශක්ති වැඩසටහන

මේ යටතේ දිවයින පුරා ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 45 ක් මගින් පාසල් හැර ගිය සිසුන් හා තරුණ තරුණියන් සඳහා පරිගණක පුහුණුව හා අන්තර්ජාල පහසුකම් ලබාදීම සිදු කෙරේ. තවද නව ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී.

නව ශක්ති වැඩසටහන මගින් ස්වයං රැකියා සඳහා අවශ්‍ය ණය පහසුකම් ලබාදී ස්වයං රැකියා සඳහා තරුණ පිරිස් පෙළඹවීම හා එමගින් අමතර ආදායම් උපයාගැනීමටත් රැකියා නිර්මාණය කරගැනීමටත් ඉඩප්‍රස්ථා සළසයි.

**මෙම වැඩසටහන යටතේ 2011 වර්ෂයේ සපුරාගනු ලැබූ ඉලක්කයන්**

- ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන 45 ක් පවත්වාගෙන යාම.
- 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන වල සිසුන් 27,911 ක් පමණ ලියාපදිංචි කිරීම.
- 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා තොරතුරු තාක්ෂණ වැඩසටහන් 862 ක් පැවැත්වීම.
- ව්‍යවසායකයින් 52 දෙනෙකු සඳහා ණය පහසුකම් සැපයීම.

### 3.1.2 ක්‍රීඩා හා සංස්කෘතික සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ ක්‍රීඩා කුසලතාවයන් සහ සංස්කෘතික කටයුතු වතු අංශය තුළ වැඩි දියුණු කිරීමයි. ඒ අනුව වතුකරයේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා කුසලතාවයන් දියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම නෝර්වුඩ් තොන්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණයි. මේ අතර රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් තරුණ තරුණියන් සඳහා සංස්කෘතික වැඩසටහන් හා පහසුකම් ලබාදීම තුලින් සංස්කෘතික කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාකරමින් පවතී.

**2011 වර්ෂයේ සපුරාගනු ලැබූ ඉලක්කයන්**

- ආගමික මධ්‍යස්ථානය, සංස්කෘතික මධ්‍යස්ථානය සහ පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය කිරීම
- සෞන්දර්ය පාසල නිල වශයෙන් 2011 අගෝස්තු මස 30 වන දින විවෘත කිරීම.
- සිසුන් 62 ක් සඳහා සංගීත සහ නැටුම් පාඨමාලා පැවැත්වීම.
- ක්‍රීඩා කටයුතු සංවර්ධනය හා ඒ සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ශ්‍රී ලංකා පාපන්දු ක්‍රීඩා සංගමයේ අනුමැතියද ඇතිව පාපන්දු ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු නිම කිරීම.
- ගෘහස්ත ක්‍රීඩාංගණය ඉදිකරමින් පැවතීම.

### 3.1.3 වෘත්තීය පුහුණු වැඩසටහන

තොන්ඩමාන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය මගින් පාසල් හැර ගිය සිසුන් හා තරුණ තරුණියන් සඳහා වෘත්තිය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. මේ යටතේ පාඨමාලා 18 ක පුහුණු වැඩසටහන් පවත්වයි.

- 2011 වර්ෂයේ තරුණ තරුණියන් 369 සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.
- වර්ෂයකට තරුණ තරුණියන් 420 ක් පමණ පුහුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

## 3.2 පසුගාමී ප්‍රදේශවල සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන

ජාතික වැඩසටහන් වලින් ආවරණය නොවන ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ මූලික අවශ්‍යතා සැපයීම සහ ඔවුන් ජාතික වැඩ සටහන හා සම්බන්ධ කිරීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. අමාත්‍යාංශය යටතේ පවතින අනුබද්ධිත ආයතනක් වන වැවිලි මානව සංවර්ධන භාරය, පළාත් සභා, පළාත් පාලන ආයතන, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

මේ යටතේ ග්‍රාමීය මාර්ග, අඩිපාරවල්, ප්‍රජා ජල ව්‍යාපෘති ,පාසල් ප්‍රතිසංස්කරණය, ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම සහ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සිදු කරනු ලබයි.

මේ වැඩ සටහන යටතේ 2011 වර්ෂය සඳහා රු.මිලියන 350 ක් වෙන්කරනු ලැබ ඇත.

### 3.2.1 වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා 2011 වර්ෂයෙහි ප්‍රගතිය පහත පරිදි වේ.

| ක්‍රියාකාරකම් | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | නිම කරන ලද | නිම කරමින් පවතින |
| විදුලිය සැපයුම් | 3 | 3 | - |
| ජල සැපයුම් | 12 | 10 | 2 |
| මාර්ග සහ පදික වේදිකා | 211 | 176 | 35 |
| පාසල් ගොඩනැගිලි | 19 | 13 | 6 |
| ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධන | 11 | 10 | 1 |
| ක්‍රීඩා ව්‍යාපෘති | 52 | 48 | 4 |
| සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු | 10 | 9 | 1 |
| පොදු පහසුකම් | 40 | 33 | 7 |
| වහල නැවත සෙවිලි කිරීම | 4 | 2 | 2 |
| **එකතුව** | **362** | **304** | **58** |

### 3.2.2 පළාත් පාලන ආයතන, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ පළාත් සභා හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතින්හි 2011 දෙසැම්බර් 31 වන දිනට ප්‍රගතිය.

| ක්‍රියාකාරකම් | ව්‍යාපෘති සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|
| | | නිම කරන ලද | නිම කරමින් පවතින |
| ජල සැපයුම | 2 | 2 | 0 |
| මාර්ග සහ පදික වේදිකා | 101 | 69 | 32 |
| පාසල් ගොඩනැගිලි | 2 | 0 | 2 |
| ආගමික හා සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය | 3 | 3 | 0 |
| ක්‍රීඩා ව්‍යාපෘති | 2 | 0 | 2 |
| සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු | 1 | 1 | 0 |
| පොදු පහසුකම් | 9 | 3 | 6 |
| **එකතුව** | **120** | **78** | **42** |

## 3.3 වතු නිවාස වැඩ සටහන

වතුකරයේ නිවාස අවශ්‍යතා ඇති පවුල් සඳහා නිවසක් ලබාදීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. මෙම වැඩ සටහන ආයතන 2 ක් මගින් ක්‍රියාත්මක කරයි.

## 3.3.1 ජාතික නිවාස සංවර්ධන අධිකාරිය - විශේෂ ව්‍යාපෘති හා ස්වයං - උපකාර නිවාස වැඩසටහන

මේ යටතේ ප්‍රතිලාභී පවුල් සඳහා පර්චස් 07 ක ඉඩම් කැබැල්ලක් ලැබෙන අතර එහි පිරිවැය රුː 225,000 ක් වේ. ඉන් රුː 100,000 ණය වන අතර ඉතිරි මුදල වන රුː 125,000 ආධාරයක් වශයෙන් ලබා දෙනු ඇත. නිවාස 1,248 සකස් කරමින් පවතින අතර එයින් නිවාස 397 ක වැඩ අවසන් කර ඇත.

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන නිවාස වැඩ සටහනේ ප්‍රගතිය**

| | දිස්ත්‍රික්කය | 2011 වසර තුළ ඉදි කරමින් පැවති නිවාස සංඛ්‍යාව | 2011 වසර තුළ ඉදිකර අවසන් කළ නිවාස සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | බදුල්ල | 329 | 30 |
| 2. | මොණරාගල | 17 | 17 |
| 3. | රත්නපුර | 257 | 165 |
| 4. | නුවරඑළිය | 284 | 144 |
| 5. | මහනුවර | 173 | 13 |
| 6. | ගාල්ල | 66 | 8 |
| 7. | මාතර | 71 | 3 |
| 8. | කුරුණෑගල | 20 | 10 |
| 9. | කළුතර | 24 | - |
| 10. | සෘජු ඉදිකිරීම් | 7 | 7 |
| | **එකතුව** | **1248** | **397** |

## 3.3.2 වැවිලි මානව සංවර්ධන භාරය - නව ජීවන වතු නිවාස ව්‍යාපෘතිය

මේ යටතේ ප්‍රතිලාභී පවුල් සඳහා පර්චස් 07 ඉඩම් කැබැල්ලක් ලැබෙන අතර එහි පිරිවැය රුː 440,000 වන අතර එයින් රුː 200,000 ණය වශයෙන්ද ඉතිරි රුː240,000 ආධාර වශයෙන්ද ලබාදෙයි. මේ වන විට නිවාස 749 ඉදිකරමින් පවතින අතර එයින් නිවාස 161 ක් 2011 වසර තුළදී නිමකර ඇත.

**වැවිලි මානව සංවර්ධන භාරය මගින් ක්‍රියාත්මක කරන නිවාස ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| පළාත | 2011 වසර තුළ ඉදි කරමින් පැවති නිවාස සංඛ්‍යාව | 2011 වසර තුළ ඉදිකර අවසන් කළ නිවාස සංඛ්‍යාව |
|---|---|---|
| ගාල්ල | 80 | 25 |
| රත්නපුර | 100 | 50 |
| බදුල්ල | 117 | 0 |
| කෑගල්ල | 50 | 50 |
| මහනුවර | 92 | 16 |
| හැටන් | 240 | 0 |
| නුවරඑළිය | 70 | 20 |
| **එකතුව** | **749** | **161** |

# 4 අමාත්‍යංශය විසින් 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් සහ ව්‍යාපෘතිවල මූල්‍යමය ප්‍රගතිය

## 4.1 පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති

| උප ව්‍යාපෘති | වැය විෂය | කාණ්ඩය/ වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන (රු:) | 2011.12.31 දිනට වියදම (රු:) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 3 | 2502 | දියර කිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම | 40,616,000.00 | 32,853,767.00 | 80.89% |
| 4 | 2502 | සත්ව අභිජනන ගොවිපල පිහිටුවීම | 44, 200,000.00 | 39,435,855.00 | 89.22% |
| 8 | 2502 | කිරි ගම්මාන පිහිටුවීම | 82,100,000.00 | 69,053,101.00 | 84.11% |
| 14 | 2502 | මධ්‍ය කාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන | 88,750,000.00 | 29,543,769.00 | 33.29% |
| 15 | 2502 | කිරි ගවයන් ආනයනය කිරීම (12) | 190,000,000.00 | 59,331,988.00 | 31.23% |
| 15 | 2502 | කිරි ගවයන් ආනයනය කිරීම (17) | 15,000,000.00 | 0.00 | 0.00% |
| 20 | 2502 | දැයට කිරුළ | 10,000,000.00 | 3,074,779.00 | 30.75% |
| 19 | 2502 | කුඩා හා මධ්‍ය පරිමාණ කුකුල් ගොවිපලවල් ඇති කිරීම | 20,000,000.00 | 9,137,494.63 | 45.69% |
| 13 | 2502 | ද්විත්ව කාර්යය එළුවන් 1000 ක් ආනයනය කිරීම | 175,775.00 | 22,650.00 | 12.89% |
| 11 | 2502 | කිරි ශීත කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම | 24,225.00 | 24,225.00 | 100.00% |

## 4.2 ග්‍රාමීය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති

| උප ව්‍යාපෘති | වැය විෂය | කාණ්ඩය/ වැය විෂයය/ අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන (රු:) | 2011.12.31 දිනට වියදම (රු:) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **1** | 2502 | ග්‍රාමීය ප්‍රදේශ වල ජීවනෝපාය මාර්ග හා මූලික පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් | 165,000,000.00 | 140,142,470.00 | 84.93% |
| **2** | 2502 | සමාජ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති (පසුගාමී ප්‍රදේශ වල සමාජ ආර්ථික සංවර්ධනය) | 420,000,000.00 | 367,982,590.00 | 87.61% |
| **16** | 2502 | වතු නිවාස ව්‍යාපෘතිය | 125,000,000.00 | 106,470,500.00 | 85.18% |

# 5 අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ප්‍රගතිය

## 5.1 සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 1978 දී පිහිටුවනු ලැබූ අතර ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ව රෝග පැතිරීම මැඩපැවැත්වීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනය ද වේ.

### 5.1.2. 2011 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන්/ ව්‍යාපෘතීන්වල ප්‍රගතිය

### 5.1.2.1. පශු සම්පත් සංවර්ධනය

#### 5.1.2.1.1 කිරි ගව ක්ෂේත්‍රය

**අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම**

නිෂ්පාදනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය සම්පන්න සත්ව ගහණයක් පවත්වාගෙන යාමට, මුළු දිවයින පුරා සාර්ථක රෝග වැළැක්වීම හා මර්දනය කිරීම පිණිස වන සත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම උපරිම වැදගත්කමින් යුතු වුවක් වෙයි. ශ්‍රී ලංකාවේ බෝවෙන සත්ව රෝග පැතිරීම වැළැක්වීම සඳහා එන්නත් කිරීම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග එක් වී ක්‍රියාත්මක කරන ලදී.

පේරාදෙණිය පශු පර්යේෂණ ආයතනය මගින් 2011 වර්ෂයේ දී රක්තාශ්‍රව රෝගය සඳහා එන්නත් මාත්‍රා 172,250 ක් ද කාල ගාත්‍රා රෝගය සඳහා එන්නත් මාත්‍රා 24,816 ක් ද නිෂ්පාදනය කර ඇති අතර ආනයනය කර ඇති කුර හා මුඛ රෝගය සදහා වූ එන්නත් මාත්‍රා ගණන 400,000කි. මෙම කාලය තුළදී රක්තාශ්‍රව රෝගය සඳහා 549,222 ක් ද කාල ගාත්‍රා රෝගය සඳහා 147,785 ක් ද කුර හා මුඛ රෝගය සඳහා 512,692 ක් ද වශයෙන් එළ හා මී ගවයින් ප්‍රතිශක්තිකරණය කරනු ලැබ ඇත.

සත්ව රෝග අවේක්ෂණ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර නිදර්ශක 356 ක් මේ දක්වා පරීක්ෂාවට බඳුන් කර ඇති අතර නිදර්ශක 11,343 ක් පරීක්ෂණාගාර තුළ රෝග විනිශ්චය සඳහා යොමු කොට ඇත.

**ආ. ගවයින්ගේ හා මී ගවයින්ගේ ජාන වැඩිදියුණු කිරීම**

රට තුළ කිරි නිෂ්පාදනය වැඩි කිරීම උදෙසා දේශීය එළ ගව සහ මී ගව ගහණය ගුණාත්මකව වැඩි කර ගැනීමට උසස් ආරයේ ගව ශුක්‍ර භාවිතා කර කෘත්‍රිම සිංචන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සත්ව අභිජනන වැඩසටහන වේ. ශුක්‍ර නිෂ්පාදනය කර බෙදා හැරීම, කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කිරීම, තෘණ හා පෝෂ තෘණ වර්ග හඳුන්වාදීම/සංවර්ධනය, තෘණ වගාව පිළිබඳ පුහුණුව මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය. මෙම වසර තුළදී කුණ්ඩසාලේ මධ්‍යම කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය හා පොළොන්නරුව කෘත්‍රිම සිංචන මධ්‍යස්ථානය මගින් ගව ශුකානු මාත්‍රා 220,134 ක් හා 6,874 ක් නිපදවා ඇති අතර පශු වෛද්‍ය කාර්යාල මගින් කෘත්‍රිම සිංචනයන් 185,125 ක් සිදුකර ඇත. ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින් සිදු කර ඇති ගැබ් පරීක්ෂාවන් සංඛ්‍යාව 45,905 වන අතර පැටවුන් උපත් 56,144 ක් 2011 වර්ෂයේ දී වාර්තා වී ඇත.

### ඈ. වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ වැඩසටහන

කෘත්‍රිම සිංචනයේ සැබෑ ප්‍රතිලාභ අත්කර ගැනීමට මෙන්ම ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමට කෘත්‍රිම සිංචන සේවය මගින් උපත ලැබූ වැස්සි පැටවුන් නියමිත පරිදි රැකබලා ගැනීම ගොවිපල් මට්ටමේදී බලපාන ප්‍රධාන ගැටළුව විය. රට තුල අභිජනනයට සුදුසු වැස්සියන්ගේ ගහණය වැඩි කිරීමට ද එමගින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීමට තුඩුදෙන පරිදි කෘත්‍රිම සිංචනය මගින් උපන් වැස්සි පැටවුන් ලියාපදිංචි කර තාක්‍ෂණික උපදෙස් සේවාවන් සහ අවශ්‍ය යෙදවුම් සැපයීම සඳහා 2008 දි වැස්සි පැටවුන් ඇති දැඩි කිරීමේ වැඩසටහන නැවත හඳුන්වා දෙනු ලැබීය.
මෙම වැඩසටහන යටතේ 2011 වර්ෂයේදී වැස්සි පැටවුන් 8,600 ක් ලියාපදිංචි කර ඇති අතර 8,600 රක්ෂණය කර ඇත.

### ඇ. පශු පර්යේෂණ ආයතනය තුළ තාක්ෂණික විද්‍යාගාර පිහිටු වීම

විමර්ශන කටයුතු සහ ප්‍රාදේශීය පශු විමර්ශන මධ්‍යස්ථාන එකිනෙක සම්බන්ධ කරන කේන්ද්‍රස්ථානයක් වශයෙන් හා විශේෂ පරීක්ෂණාගාරයක් ලෙස පශු පර්යේෂණ ආයතනය තුළ ස්ථාපිත කරමින් පවතී. එමෙන්ම කිරි නිෂ්පාදනය සඳහා අවශ්‍ය මුහුන් නිෂ්පාදනය, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදනවල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා කිරි සැකසුම්කරුවන්ට සහාය වීම, ක්ෂේත්‍ර විමර්ශනයන් සිදු කිරීම, පර්යේෂණ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම, ක්ෂීර රසායන විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව සහ ක්ෂීර තාක්ෂණය වැනි විෂයයන් සඳහා ගොවීන්, කිරි සැපයුම්කරුවන් සහ සිසුන් පුහුණු කිරීම ආදිය ද සිදු කරයි. මෙම ව්‍යාපෘතිය 2011 වසරේ ජනවාරි මස ආරම්භ කරන ලදි. මෙය 2012 සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### 5.1.2.1.2. එළු ක්ෂේත්‍රය

අභිජනනය සඳහා සුදුසු උසස් ආරයේ එළුවන් සැපයීම සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ඉබ්බලන්දන්ඩ හා තෙලහැර ප්‍රදේශයන්හි ජමුනාපාරි එළු ගොවිපළ දෙකක් පවත්වාගෙන යනු ලබන අතර 2011 වසරේදී සතුන් 126 ක් ගොවීන් වෙත ලබාදී ඇති අතර ක්ෂේත්‍ර මට්ටමෙහි කෘත්‍රිම සිංචනයන් 2825 සිදු කර ඇත.

### 5.1.2.1.3. සූකර ක්ෂේත්‍රය

සූකර පාලනය බොහෝ දුරට බස්නාහිර හා වයඹ යන පළාත් වලට සීමා වී ඇත. කොටදෙනියාව, සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ පිහිටුවා තිබෙන ශීත කළ ශුක්‍ර වඩි නිෂ්පාදන මධ්‍යස්ථානය 2008 දී පූර්ණ වශයෙන් ක්‍රියාකාරී තත්වයට පත්විය.

ඌරන් සඳහා කෘත්‍රිම සිංචනයන් 603 ක් මෙම වසර තුළ සිදුකර ඇති අතර එම කාලය තුළ කෘත්‍රිම සිංචනයන් මගින් බිහිකළ පැටවුන් සංඛ්‍යාව 1074 කි.

### 5.1.2.1.4. කුකුළු ක්ෂේත්‍රය

මෙරට කුකුළු කර්මාන්තය තුල පෞද්ගලික අංශය සිදු කරන වැඩ කාර්යයන් අතර රාජ්‍ය අංශයේ කාර්යය නීති සහ තත්ත්ව සහතික කිරීමට පමණක් සීමාවී ඇත.

සමහර රට වල කුරුළු උණ ව්‍යාප්ත වීම හේතුවෙන් මව් පිය සහ මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් මෙරටට ආනයනය කිරීමේ දී සීමාවන් පනවා එම රෝගය මෙරටට සංක්‍රමණය වීම වැළැක්වීමට ගුවන් තොටුපළ හා වරායන්වල පිහිටුවා ඇති සත්ව නිරෝධායන කාර්යාල මගින් විශේෂ රෝග වළක්වාලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම වර්ෂයේදී පශු පර්යේෂණ ආයතනය මගින් කුඩා පරිමාණ කුකුල් ගොවිපළ වෙත නිකුත් කිරීම සඳහා රැනිකට් රෝගය වැළැක්වීමේ එන්නත් මාත්‍රා 1,407,000 ලබා දී ඇත.

## 5.1.2.2 සත්ව සෞඛ්‍ය වැඩි දියුණු කිරීම

### අ. කුරුළු උණ මෙරටට ඇතුළු වීම වැලැක් වීම

ආසියාවේ රටවල් කිහිපයක ආර්ථිකයට බලපෑ අති ව්‍යාධි ජනක කුරුළු උණ රෝගයෙන් තොර රටක් ලෙසට පැවතීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබී ඇත. මෙරටට කුරුළු උණ ඇතුළු වුයේ නම් එම රෝගය මැඩපවත්වා තුරන් කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සුදානම් කර ඇත.

පශු පර්යේෂණ ආයතනය සතු රෝග විනිශ්චය පහසුකම් පුළුල් කරනු ලැබීය. ජාතික සහ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීහු බොහෝ සංඛ්‍යාවක් අති ව්‍යාධි ජනක කුරුළු උණ වැලැක්වීම සහ මැඩලීම සම්බන්ධ පුහුණුවක් ලබාදී/පුහුණුව ලබා දීමට යොමු කර රෝග පිළිබඳ දැනුවත් කිරීම් සිදුකරනු ලැබීය.

මෙම අති ව්‍යාධි ජනක කුරුළු උණ විමර්ශන වැඩසටහන යටතේ කෙෂ්ත්‍රයෙන් ලබාගත් සාම්පල 5,892 ක් මෙම කාලය තුළදී පරීක්ෂාවට භාජනය කරනු ලැබ ඇති අතර ඒවා රෝගයෙන් තොර බවට තීරණය කෙරිණි.තවද ක්ෂේත්‍ර මට්ටමේ පුහුණු වැඩසටහන් 19 ක් පවත්වා ඇත.

### ආ. කුරුළු උණ සඳහා පෙර සූදානම හා ප්‍රතිචාර දැක්වීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘති සඳහා අරමුදල් ලෝක බැංකුව මගින් සපයනු ලැබූ අතර (රුːමිලියන 140) ව්‍යාපෘති කාලය වසර 3 කි. 2011 මාර්තු මස 31 වන දින මෙය අවසන් කරන ලද අතර මෙමගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික වසංගතවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව හැදෑරීම සඳහා 49 දෙනෙකුට හා ආපදා කළමණාකරණය පිළිබද කෙටි කාලීන පාඨමාලාවක් හැදෑරීම සඳහා 55 දෙනෙකුට ද පහසුකම් සැළසීම.
- යාපනය හා වාරියපොල පශු පර්යේෂණ ආයතන 2ක් පිහිටුවීම.
- පොල්ගොල්ල වෛරස් විද්‍යාගාරය සහ ගන්නෝරුව මධ්‍යම පශු පර්යේෂණායතනය ප්‍රතිසංස්කරණය කිරීම.
- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය සංවර්ධනය කිරීම හා අදාළ උපකරණ පරිහරණය පිළිබඳව නිළධාරීන් 10 දෙනෙකු පුහුණු කිරීම.
- ICEAPH වන්නිගම, සීප්පුකුලම යන පුහුණු ආයතන ප්‍රතිසංස්කරණය කිරීම.
- ව්‍යාපෘතියේ හඳුනාගත් ක්‍රියාකාරකම් සඳහා උපදේශක ධූර පිරිනැමීම.

### ඇ. ක්ෂේත්‍රයේ රෝග හඳුනා ගැනීමේ පහසුකම් වැඩි දියුණු කිරීම

කෙෂ්ත්‍රයේ පශු වෛද්‍ය කාර්යාලවල කාර්යය මණ්ඩලය සඳහා රෝග හඳුනා ගැනීමේ කටයුතු වලදී අවශ්‍ය තාක්‍ෂණික සේවාවන් සැපයීම පශු විමර්ශන මධ්‍යස්ථානයන් මගින් සිදු කරනු ලබයි. නිෂ්පාදනයන් වැඩිකර පශු සම්පත් නිෂ්පාදිත වලින් රට ස්වයංපෝෂිත කිරීමේ කඩිනම් වැඩපිළිවෙල යටතේ සෑම දිස්ත්‍රික්කයක් තුළම පශු විමර්ශන මධ්‍යස්ථානයක් ස්ථාපනය කළ යුතුය යන ප්‍රතිපත්තිමය තීරණය 2006 වසරේදී අමාත්‍යංශය මගින් ගනු ලැබීය.

2011 වසර තුළ නව පශු විමර්ශන මධ්‍යස්ථානයන් 03ක් දඹුල්ල, වාරියපොල හා යාපනය යන ස්ථානවල ඉදි කරන ලදී.

#### ඈ. ප්‍රාදේශීය මට්ටමින් පශු රෝහල් ඉදිකිරීම

ග්‍රාමීය ප්‍රජාව සඳහා වඩාත් කාර්යක්ෂම සත්ව සෞඛ්‍යය සේවාවක් සැපයීමේ අරමුණින් සෑම පළාතක් තුළම නවීන තාක්ෂණික පහසුකම් හා ජංගම සේවාවන් සහිත පශු රෝහලක් පිහිටුවීමේ අවශ්‍යතාවය මතුව ඇත.

මේ යටතේ නුවරඑළියෙහි පශු රෝහලක් ඉදිකර 2011 වසරේදී මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී.

### 5.1.2.3. මානව සම්පත් සංවර්ධනය

#### අ. ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය මගින් සත්ව පාලනයේ යෙදීම ආර්ථිකමය ලෙසින් ස්වයං රැකියාවක් ලෙසට නියැලී සිටිය හැකි කටයුත්තක් සේ කරගෙන යාමට මූලික දැනුමක් සහ පුහුණුවක් ලබා දෙයි. කිරි පට්ටි පාලනය, කුකුළු පාලනය, සූකර පාලනය සහ කිරි සැකසීම පිළිබඳව රජයේ ගොවි පුහුණු මධ්‍යස්ථානයන්හිදී නේවාසික පුහුණු වැඩසටහන් කරගෙන යනු ලැබේ.

මේ යටතේ තරුණ තරුණියන් 105 ක් සහ ව්‍යවසායකයින් 247 ක් සඳහා පුහුණුව ලබා දෙන ලද අතර ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පුහුණුව ලැබූ පිරිස 68 කි.

#### ආ. හැකියාවන් ගොඩනැගීමේ අධ්‍යාපනික පුහුණු වැඩසටහන්

සත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නවීන ප්‍රායෝගික සත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන් සහ ගොවීන් හට හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ගොවි පුහුණු වැඩ සටහන් 121 ක් සංවිධානය කරන ලද අතර එමගින් ව්‍යවසායකයින්/නිලධාරීන් සහ ගොවීන් 3907 දෙනෙක් 2011 වර්ෂයේදී පුහුණු කරන ලදී.

පශු වෛද්‍ය සේවයේ ගුණාත්මක තත්ත්වය උසස් කිරීම සඳහා පශු වෛද්‍ය නිලධාරීන් 06 දෙනෙකු සඳහා විද්‍යාපති පාඨමාලා වෙනුවෙන් මූල්‍යාධාර සැපයීම සහ සිසුන් 39 දෙනෙකු කුණ්ඩසාලේ පශු පාලන පාසලෙහි දෑ අවුරුදු ඩිප්ලෝමා වැඩසටහන් සඳහා යොමු කිරීම සිදු කරන ලදී.

#### ඇ. තොරතුරු ව්‍යාප්ත කිරීම

දෙපාර්තමේන්තුව විසින් දැයට කිරුළ(බුත්තල), කොළඹ(එක්ස්පෝ 2011), ත්‍රිකුණාමලය(නැගෙනහිර එක්ස්පෝ 2011), මඩකලපුව(ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය 2011) හා වව්නියාව වශයෙන් ජාතික මට්ටමේ ප්‍රදර්ශන පහක් සඳහා සහභාගි විය. මෙමගින් දැනටමත් සත්ව පාලන කටයුතු වල නිරත වී සිටින්නා වූ කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින්ට සහ සත්ව පාලන කටයුතු වල නිරත වීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුමක් සහ තොරතුරු ලබා දීමක් සිදුකරන ලදී.

මෙම කාලය තුලදී තොරතුරු ඇතුළත් කුඩා පරිමාණයේ පොත් 30234 ක් නිකුත් කරන ලද අතර ගුවන් විදුලි ප්‍රචාරණ වැඩසටහන් 115 ක් පවත්වන ලදී.

## 5.1.2.4. නීතිමය කටයුතු සහ සේවාවන්

### අ. කුකුළු ගොවිපල ලියාපදිංචි කිරීම

ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් කුකුළු ගොවිපල ලියාපදිංචි කිරීම 2011 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. කුකුළු ගොවිපල් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මගින් බෝවන රෝග මර්ධනය කිරීම, තාක්ෂණික සහය වැඩසටහන් සහ සත්ව නිෂ්පාදනයන් වල ගුණාත්මකභාවය පාලනය කිරීම පහසුවෙන් කරගෙන යාමට හැකිය.

ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් 2011 වර්ෂයේදී ගොවිපල් 7458ක් ලියාපදිංචි කර තිබේ. ඒ අනුව විද්‍යුත් දත්ත සමුදායක් ස්ථාපිත කරනු ලැබේ.

### ආ . සතුන් හඳුනාගැනීමේ, සිටින ස්ථානය නිර්ණය කරගැනීමේ ක්‍රමෝපායන් සහ මධ්‍යම තොරතුරු පද්ධතියක් පිහිටුවීම

මෙම වැඩසටහනෙහි දෙවන අදියර 2011 වර්ෂයේදී ඇරඹුනු අතර එහිදී ලියාපදිංචි කරන ලද ගොවිපල වල සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සහ සත්ව ගොවිපල පිළිබඳ දත්ත එකතුව ස්ථාපනය කිරීම සිදුකරන ලදී.

මෙම ව්‍යාපෘතිය යටතේ, ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කල ගොවිපල නිරීක්ෂණය කරනු ලබන අතර ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදු කරයි. මේ වන විට සතුන් 101,840 කගේ කන් සලකුණු සවිකර ඇත. ඉතිරි සත්ව ගහනය සහ ඔවුන්ගේ පැටවුන් ඉදිරි වර්ෂ වලදී හඳුනා ගැනේ. මෙය සත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැළැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ.

### ඇ. රජයේ පශු වෛද්‍ය කාර්යාලයන්හි සේවා සැපයුම් පද්ධතීන් වැඩි දියුණු කිරීම.

ග්‍රාමීය පෙදෙස් වල සත්ව පාලන අංශයේ යෙදෙන පිරිසගේ අවශ්‍යතාවයන් සපුරාලන ක්ෂේත්‍ර මට්ටමේ සිටින්නා වූ මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන් වනුයේ රජයේ පශු වෛද්‍ය කාර්යාල වේ. බිම් මට්ටමින් කෙරෙන සේවාවන් සැපයීම මෙකී කාර්යාලයන් සතුව තිබෙන්නාවූ පහසුකම් මත බොහෝ සෙයින් රඳා පවතියි. එබැවින් අවම පරිදි රෝග විනිශ්චය කිරීම, ව්‍යාප්ති, සන්නිවේදනය සහ ප්‍රවාහන පහසුකම් මෙම පිරිසට සැපයිය යුතුව ඇත.
වර්තමානයේ බොහෝ පශු වෛද්‍ය කාර්යාලවල ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති අතර බොහෝ කාර්යාලවල අත්‍යවශ්‍ය උපකරණවල හිඟයක් පවතී. ඒ අනුව මූලික පියවරක් ලෙස 2008 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය මගින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම හා කාර්යාල වලට අවශ්‍ය උපකරණ ලබා දීම සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදී කටාන, බිංගිරිය, බෙන්තොට, ඉමදූව, පදියතලාව, කල්තොට සහ ඇටම්පිටිය යන පශු වෛද්‍ය කාර්යාල ස්ථාපනය කිරීම සිදුකරන ලදී.

කෑගල්ල, මාතලේ, යාපනය, අනුරාධපුර, මහනුවර, නුවරඑළිය, ගාල්ල, මඩකලපුව සහ පුත්තලම යන දිස්ත්‍රික්ක තුළ යටියන්තොට, ගලිගමුව, දඹුල්ල, කරවෙඩ්ඩි, කැකිරාව, හතරලියද්ද, ආගරපතන, හබරාදූව, රිදීතැන්න, දංකොටුව යන ප්‍රදේශයන්හි පශු වෛද්‍ය කාර්යාල ඉදිකිරීමේ කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර ඇත.

## 5.2 මිල්කෝ පුද්ගලික සමාගම.

සී/ස මිල්කෝ පුද්ගලික සමාගම රජයට අයත් කිරි නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනයක් වන අතර කොළඹ (නාරාහේන්පිට), දිගන, අඹේවෙල හා පොළොන්නරුවේ පිහිටි කර්මාන්ත ශාලා 4 ක හිමිකම් දරයි. එහි ප්‍රධාන නිෂ්පාදන වර්ග 10 ක් ද ගබඩා ඒකක 52 ක්ද "හයිලන්ඩ්" සන්නම් නාමයෙන් ඇත. ප්‍රධාන නිෂ්පාදන වර්ග අතරට ජීවානුහරණය කරන ලද හා පාස්චරීකරණය කරන ලද කිරි, යෝගට්, අයිස්ක්‍රීම්, බටර්, එළගිතෙල්, චීස්, මුදවන ලද කිරි, උකු කිරි සහ සම්පූර්ණ යොදය සහිත කිරිපිටි අන්තර්ගත වේ.

- වර්තමානයේදී කිරි එකතු කිරීම දිනකදී ලීටර් 160,000 ක් දක්වා වර්ධනය වී ඇත.
- සමාගම සඳහා කිරි සැපයෙන කිරිගොවි සමිති සංඛ්‍යාව 2,300 කි.
- මිල්කෝ කිරි ශීතකරණ මධ්‍යස්ථාන සංඛ්‍යාව 77 කි.
- සමාගම සතුව අලෙවි මධ්‍යස්ථාන 11 ක් වන අතර වෙළඳ නියෝජිතයින් 26 දෙනෙකුගෙන් සමන්විතය.
- නැවුම් කිරි ලීටරයක් සඳහා ගෙවනු ලබන මිල රු:50 දක්වා ඉහළ නැංවීම සිදුකර ඇත.

**2011 වසර තුළ මිල්කෝ නිෂ්පාදන**

| නිෂ්පාදනය | නිෂ්පාදන ප්‍රමාණය | නිෂ්පාදිතය |
|---|---|---|
| පාස්චරීකරණය කරන ලද කිරි | ලීටර් මිලියන | 7.38 |
| ජීවාණුහරණය කරන ලද කිරි | ලීටර් මිලියන | 4.98 |
| චීස් | කිලෝ ග්‍රෑම් | 9616 |
| අයිස්ක්‍රීම් | ලීටර් මිලියන | 4.99 |
| මුදවන ලද කිරි | ලීටර් මිලියන | 0.629 |
| උකු කිරි | කිලෝ ග්‍රෑම් | 293,314 |
| යෝගට් | ලීටර් මිලියන | 5.09 |
| බටර් | කිලෝ ග්‍රෑම් | 563,553 |
| සම්පූර්ණ යොදය සහිත කිරි පිටි | මෙ.ටො | 1322.3 |
| යොදය රහිත කිරි පිටි | මෙ.ටො | 86.55 |

## 5.3 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය.

ජාතික පශු සම්පත් මණ්ඩලය අක්කර 40,000 ක් පමණ වන භූමි ප්‍රමාණයක් කළමනාකරණය කරනු ලබයි. සත්ව පාලනයේ නිරතවන ගොවීන් හට උසස් ආරයේ සතුන් සැපයීම මෙන්ම කෘෂි හා සත්ව නිෂ්පාදන සැපයීම ප්‍රධාන අරමුණ වේ.

අභිජනන කටයුතු සඳහා නිකුත් කරන ලද සතුන් පිළිබඳ විස්තර පහත දැක්වේ .

**අභිජනන කටයුතු සඳහා නිකුත් කරන ලද සතුන්-2011**

| සතුන් වර්ගය | 2011 වර්ෂය සඳහා ඉලක්ක ගත සංඛ්‍යාව | 2011 -12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|
| එළගව (පිරිමි) | 749 | 839 |
| එළගව (ගැහැණු) | 708 | 539 |
| මීගව (පිරිමි) | 191 | 127 |
| මීගව (ගැහැණු) | 125 | 58 |
| ඌරන් | 3,584 | 2885 |
| එළුවන් | 312 | 503 |
| බැටළුවන් | 526 | 181 |

**කිරි සහ කිරි ආශ්‍රිත අගය එකතු කරන ලද නිෂ්පාදන-2011**

| නිෂ්පාදනය | 2011 වර්ෂය සඳහා ඉලක්ක ගත සංඛ්‍යාව | 2011 -12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|
| එළකිරි (ලීටර්) | 4,026,312 | 2,868,332 |
| මීගව කිරි (ලීටර්) | 823,340 | 633,850 |
| එළුකිරි | 32,876 | 10,753 |
| යෝගට් (කෝප්ප) | 1,102,016 | 444,914 |
| මුදවපු කිරි (ලීටර්) | 63,240 | 71,277 |
| ජීවානුහරණය කරන ලද කිරි (බෝතල්) | 182,200 | 20,317 |
| මුදවපු මීකිරි (ලීටර්) | 461,362 | 334,312 |

**සත්ව ආහාර සහ තෘණ නිෂ්පාදනය-2011**

| නිෂ්පාදනය | 2011 වර්ෂය සඳහා ඉලක්ක ගත සංඛ්‍යාව | 2011 -12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|
| ගව ආහාර (මෙ ටො) | 494 | 750 |
| කුකුළු ආහාර (මෙ ටො) | 1079 | 2161 |
| ඌරු ආහාර (මෙ ටො) | 476 | 265 |
| බැටළු ආහාර (මෙ ටො) | 12 | 47 |
| තෘණ සංවර්ධන (අක්කර) | 625 | 1,178 |
| වියළි තෘණ (මෙ ටො) | 638 | 348 |
| සයිලේජ් (මෙ ටො) | 600 | 369 |
| ඛණිජ මිශ්‍රණය (මෙ ටො) | 30 | 20 |

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් 2011 වසරේ දෙසැම්බර් මස අග දක්වා නිපදවන ලද කුකුළු මස්, බිත්තර සහ නිකුත් කරන ලද කුකුළු පැටවුන් පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

**නිෂ්පාදනය කරන ලද කුකුළු මස්, බිත්තර සහ නිකුත් කරන ලද කුකුළු පැටවුන් -2011**

| නිෂ්පාදනය | 2011 වර්ෂය සඳහා ඉලක්ක ගත සංඛ්‍යාව | 2011 -12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|
| බ්‍රොයිලර් කුකුළු පැටවුන් | 2,697,199 | 2,329,205 |
| ලේයර් කුකුළු පැටවුන් | 1,136,851 | 1,141,007 |
| බිත්තර | 1,952,161 | 2,095,328 |
| කුකුළු මස් (කුකුළන්) | 11,400 | 37,161 |
| වටු බිත්තර | 127,500 | 42,704 |

ඉහත ක්‍රියාදාමයට අමතරව පහත සඳහන් ක්‍රියාකාරකම් ද මේ යටතේ සිදු කරන ලදී.

- පශු ගොවීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගොවි පුහුණු වැඩ සටහන් 110 ක් පැවැත්වීම.
- කාබනික පොහොර මෙට්‍රික් ටොන් 265 ක් නිෂ්පාදනය කිරීම.
- එළදෙනුන් 3,064 ක් සඳහා කෘත්‍රිම සිංචනය සිදුකිරීම.
- පොල්ගෙඩි 19,941,373 ක් එළදාව වශයෙන් ලබාගැනීම හා පොල් තෙල් ලීටර 8,460 ක් නිපදවීම.
- රබර් ෂීට් මෙට්‍රික් ටොන් 5 නිෂ්පාදනය කිරීම.

**ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් වර්ෂය තුලදී සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය**

| | සංවර්ධන ක්‍රියාකාරකම | 2011 -12-31 දිනට ප්‍රගතිය |
|---|---|---|
| 1 | තෘණ බීජ ආනයනය (කි.ග්‍රෑ*) | බ්‍රැකේරියා ඩිකම්බන්ස් වර්ගයෙන් කි.ග්‍රෑ 4000, TD-58 වර්ගයෙන් කි.ග්‍රෑ 160 හා මොම්බාසා ගිනියා වර්ගය ද ඇතුළුව තෘණ බීජ කි.ග්‍රෑ 5,700 ක් තායිලන්තයෙන් හා ඔස්ට්‍රේලියාවෙන් ආනයනය කිරීම. |
| 2 | UHT ටෙට්‍රා පැකට්ටු වෙළඳ පොළට හඳුන්වා දීම (ලීටර) | 86,869 |
| 3 | බිත්තර රක්කවනාගාරයෙහි ධාරිතාවය වැඩි කිරීම | මාරවිල ගොවිපළට අයත් ඉන්කියුබේටර අංක 02, කැනේඩියානු තාක්ෂණ ශිල්පීන්ගේ ආධාරයෙන් සම්පූර්ණයෙන්ම අළුත්වැඩියා කිරීම හා එමගින් වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන කුකුළු පැටවුන් සංඛ්‍යාව මිලියන 0.5 සිට මිලියන 1.0 දක්වා වැඩි කිරීම. |
| 4 | දිනක් වයසැති කුකුළු පැටවුන් ආනයනය | "දිවි නැගුම" ප්‍රතිලාභීන් සඳහා බෙදාදීමට දිනක් වයසැති බිත්තර දමන (ලේයර්)කුකුළු පැටවුන් 175,000 ක් ආනයනය කරන ලදී. |
| 5 | මව් සතුන් ආනයනය | මිරිස්වත්ත සහ කරඳගොල්ල ගොවිපොළ සඳහා බ්‍රොයිලර් මව් සතුන් 14,850 ක් ආනයනය කරන ලදී. |
| 6 | කිරිගව පාලන අංශයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය | කිරි දෙවීමේ කටයුතු වල ගුණාත්මකභාවය වැඩි කිරීමේ අරමුණින් බෝපත්තලාව සහ ඩයගම ගොවිපොළ සඳහා මෙම වසරේදී නව කිරි දොවන යන්ත්‍ර දෙකක් ලබා දීම. |
| 7 | ලිංග නිර්ණය කරන ලද ශුක්‍රාණු මගින් කෘත්‍රිම සිංචනය | උඩරට සහ පොල් ත්‍රිකෝණයට අයත් ප්‍රදේශවල පිහිටි ගොවිපොළ තුළ දී කෘත්‍රිම සිංචනයන් 200 ක් සිදුකර ඇත. |
| 8 | "දිවි නැගුම" කෘෂිකාර්මික වැඩසටහන | "දිවි නැගුම" ජාතික වැඩසටහනට දායක වීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් අක්කර 295 ක භූමි භාගයක් තුළ එළවළු හා අනෙකුත් භෝග වගා කරන ලදී |
| 9 | තොරතුරු තාක්ෂණ අංශයෙහි සංවර්ධනය | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළ අතර තොරතුරු ජාලයක් ඇති කිරීමේ පළමු අදියර ලෙස ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙහි LAN පද්ධතියක් ස්ථාපනය කරන ලදී. තවද ICTA ආයතනයෙහි නිර්දේශ පරිදි ජා. පශු.සං. මණ්ඩලයෙහි තොරතුරු තාක්ෂණ අංශයක් ස්ථාපනය කරන ලදී. |

## 5.4 සී/ස ලිබියානු කෘෂිකාර්මික සහ පශු සම්පත් සංවර්ධන සමාගම

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ ලිබියානු අරාබි විදේශ ආයෝජන සමාගම මගින් ආරම්භ කරන ලද හවුල් ව්‍යාපාරයක් ලෙස සී/ස ලිබියානු කෘෂිකාර්මික සහ පශු සම්පත් සංවර්ධන සමාගම බිහිවිය. මෙම සමාගමේ කොටස් වල වටිනාකමින් සියයට 51 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සතුව ඇති අතර සියයට 49 ක් ලිබියානු අරාබි විදේශ ආයෝජන සමාගම සතුව ඇත.

### 5.4.1 කෘෂිකාර්මික කටයුතු

මාවත්ත ගොවිපළෙහි ඉඩම් අක්කර 347 ක් තුළ පොල් ගස් 8,000 කින් සමන්විත වන ලෙස පොල් වගා කොට ඇත. 2011 වසර තුළ පොල් ගෙඩි 321,990 ක් එකතු කොට ඇති අතර කොප්පරා කිලෝ ග්‍රෑම් 4,700 ක් නිපදවා ඇත.

### 5.4.2 සත්ත්ව පාලන කටයුතු

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යංශයෙහි මගපෙන්වීම හා සහයෝගය ඇතිව මාවත්ත ගොවිපොළ තුළ කුකුළු අභිජනන කටයුතු නැවත අරඹන ලදී. මෙමගින් කුකුළු පැටවුන් 253,280 ක් හා බිත්තර 371,500 ක් ලබාගැනීමෙන් උපයන ලද ආදායම රු:24,555,150 කි.

බිත්තර දමන කුකුළු ඒකකයෙහි 2011 වසර තුල  නිපදවන ලද බිත්තර සංඛ්‍යාව 577,437 කි.

| | බිත්තර | කිරි(ලීටර්) | කිරි හට්ටි (මි.ලි 80) | කිරි හට්ටි (මි.ලි 150 ) | කිරි හට්ටි (ලීටර් 1 ) |
|---|---|---|---|---|---|
| **එකතුව** | 371,500 | 7,300 | 4,098 | 3,569 | 3,268 |

## 5.5 සීමාසහිත මහවැලි පශු සම්පත් සමාගම

### 5.5.1 පසුබිම

සීමාසහිත මහවැලි පශු සම්පත් සමාගම 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස 1989 දී පිහිටුවන ලදී. සීමාසහිත මහවැලි පශු සම්පත් සමාගමෙහි කොටස්කරුවන් වන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික සංවර්ධන බැංකුව සහ නෙදර්ලන්ත සංවර්ධන මූල්‍ය සංස්ථාවයි. මෙම සමාගම හා සම්බන්ධ වී සිටින මහවැලි "එච්" කලාපයේ පදිංචිකරුවෝ ද එහි කොටස්කරුවෝ වෙති.

මහවැලි එච් කලාපයේ ගොවීන් කෘෂිකර්මික සහ සත්ව පාලන කටයුතු වලට උනන්දු කරවීම මගින් ඔවුන්ගේ ආදායම් ඉහළ නැංවීම, රැකියා අවස්ථා ඇති කිරීම හා සුභසාධනය ඇති කිරීම මෙම ආයතනය පිහිටුවීමේ එක් මූලික අරමුණක් වේ.

කුකුළු පාලනය, ඒ ආශ්‍රිත නිෂ්පාදන සිදු කිරීම සහ අලෙවි කිරීම යන කාර්යයන්හි ආයතනය නියුතු වන අතර ඊට අයත් කුකුළු ගොවිපොළ මහවැලි "එච්" කලාපයේ තඹුත්තේගම පිහිටා ඇත. එය බ්‍රොයිලර් මව් සතුන් සහිත අභිජනන ඒකකයක්, අර්ධ ස්වයංක්‍රීය බිත්තර රක්නාගාරයක් සහ බ්‍රොයිලර් ඒකකයකින් සමන්විතය.

### 5.5.2 මෙම සමාගමෙහි අවධානය ප්‍රධාන වශයෙන් යොමු වී ඇත්තේ

වර්තමානයේ මෙම සමාගමෙහි ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් නිෂ්පාදනය කෙරෙහිය. තවද උතුරු මැද පළාතේ සහ උතුරු පළාතේ ගොවීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කැපවීමෙන් කටයුතු කරයි.

### 5.5.3 2010 /2011 වර්ෂවල සපුරා ගනු ලැබූ ඉලක්කයන්

පසුගිය මූල්‍ය වර්ෂ වලට සාපේක්ෂව මෙම මූල්‍ය වර්ෂයේ ආයතනයේ පිරිවැටුම සහ ලාභය ඉහළ යාමක් දක්නට ලැබේ.

| | 2008/2009 | 2009/2010 | 2010/2011 |
|---|---|---|---|
| පිරිවැටුම ( රු:) | 372,431,203 | 161,794,261 | 205,712,970.71 |
| ශුද්ධ ලාභය ( රු.) | (1,723,321) | (5,416,693) | 3,991,510.08 |

ඉහත තත්ත්වය වළක්වා 2010/2011 වර්ෂ වල සුභවාදී වර්ධනයක් ඇතිවීමට හේතු වු මුලික කරුණු සහ ලාභ උපයා ගැනීමට ගෙන ඇති ප්‍රධාන පියවරවල්.

- සාමාජික ගොවින් සංඛ්‍යාව 68 දක්වා ඉහළ නැංවීම.
- ධාරිතාවය සියයට 80 - 90 දක්වා ඉහළ නැංවීම.
- පසුගිය වර්ෂයෙහි වර්ෂයකට දෙවරක් පමණක් ආනයනය කරන ලද මව් සතුන් කාණ්ඩ මෙම වර්ෂයේදී කාණ්ඩ 6 දක්වා ඉහළ නැංවීම.
- ආයතනය තුළ ශක්තිමත් පරිපාලන ක්‍රම හඳුන්වාදිම.

### 5.5.4 2011/2012 සහ ඉදිරි සංවර්ධන සැලසුම්

වර්ෂයකට කාණ්ඩ 6 ක් දක්වා (එක් කාණ්ඩයකට 2000 බැගින්) මව් සතුන් ආනයනය කිරීම මගින් දිනක් වයසැති කුකුළු පැටවුන් නිෂ්පාදනය හා බ්‍රොයිලර් මස් නිෂ්පාදනය ඉහළ නැංවීම, මහවැලි පශු සම්පත් සමාගමේ සාමාජික ගොවීන් සංඛ්‍යාව 75 සිට 85 දක්වා වර්ධනය කර ගැනීම සහ බ්‍රොයිලර් කුකුළන් 10,000 ක් සඳහා අවශ්‍ය වන නිවාස දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගෙන අඩු වියදමින් තැනීමටත් එමගින් අවම වශයෙන් 2012 පළමු වන කාර්තුව තුළ මසකට කිලෝ ග්‍රෑම් 15,000 ක් නිකුත් කිරීමටත් සැලසුම්කර ඇත.

**2011/2012 වර්ෂ සඳහා පස් අවුරුදු නිෂ්පාදන සැලැස්ම**

| වසර | බිත්තර නිෂ්පාදනය | කුකුළු පැටවුන් නිෂ්පාදනය | බ්‍රොයිලර් නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|
| 2011/2012 | 1,490,000 | 1,164,500 | 474,000 |
| 2012/2013 | 1,490,000 | 1,164,500 | 660,000 |
| * 2013/2014 | 1,620,000 | 1,200,000 | 846,000 |
| 2014/2015 | 1,800,000 | 1,450,000 | 1,400,000 |
| 2015/2016 | 1,800,000 | 1,450,000 | 1,400,000 |

* බිත්තර රක්නාගාරයේ ධාරිතාවය සහ මව් සතුන් කාණ්ඩය වැඩිකිරිමෙන් පසු අපේක්ෂිත නිශ්පාදනයන්හි වැඩිවීම

## 5.6 සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම.

සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම අභාවප්‍රාප්ත ගරු සෞම්‍යමූර්ති තොන්ඩමාන් මැතිතුමා ස්මරණය කිරීම පිණිස 2005 අංක 19 දරණ පනත මගින් පිහිටුවන ලදී.

මෙම පදනම කළමණාකරණ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන අතර, අභාවප්‍රාප්ත ගරු සෞම්‍යමූර්ති තොන්ඩමාන් මැතිතුමාගේ මුණුපුරු ගරු ආරුමුගන් තොන්ඩමාන් මැතිතුමා එම කළමණාකරණ මණ්ඩලයේ යාවජීව සාමාජිකයෙකු වන්නේය.

### 5.6.1 සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනම හරහා ක්‍රියාත්මක වන ව්‍යාපෘති

#### 5.6.1.1 ප්‍රජාශක්ති (E-kiosk Centres) මධ්‍යස්ථාන

මෙම ව්‍යාපාතියේ අරමුණ වූයේ විවිධ ප්‍රදේශවල ප්‍රජාශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය පෘථුල ලෙස භාවිතා කිරීම හා යොදා ගැනීම සහාය කර ගනිමින් අඩු වරප්‍රසාදලත් වතුකරයේ ප්‍රජාවට විස්තීර්ණ වූත්, අංග සම්පූර්ණ වූත්, සමාජ ආර්ථික සංවර්ධනයක් ලබාදීමය. මෙම ව්‍යාපෘති මගින් වරප්‍රසාද අඩු ප්‍රජාවට අන්තර්ජාල හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුමද ලබා දෙනු ඇත.

මෙම ව්‍යාපෘතිය වතුකරයේ ප්‍රජාවගේ අධ්‍යාපනික, සාමාජික, සංස්කෘතික හා ප්‍රජා ක්‍රියාකාරකම් පිළිබඳ ඒකාබද්ධතාවයක් ඇති කරවා ගැනීම පමණක් නොව ඔවුන්ට එක්සත්, මනා දැනුමක් ඇති ස්වයංපෝෂිත සමාජයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වූ විපර්යකාර්යයකු ලෙස තාක්ෂණය භාවිතා කිරීම සඳහා වූ සහයවන්නෙකු ද වේ.

**ප්‍රජාශක්ති ව්‍යාපෘතිය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ.**

- පරිගණක භාෂාව හා අන්තර්ජාල භාවිතය උගන්වන ඉගැන්වීමේ මධ්‍යස්ථාන ජාලයක් ලෙස ක්‍රියාත්මක වීම හා මූලික අධ්‍යාපනය පමණක් නොව අනාගත සංවර්ධනාත්මක ව්‍යාපෘති පිළිබඳ සැළකිල්ල දක්වමින් ප්‍රාදේශීය මට්ටමෙන් දැනුම ලබා දෙන ප්‍රජා මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වීම.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය ප්‍රජා කටයුතුවලට භාවිතා කිරීම සඳහා වතුකරයේ ප්‍රජාවට පහසුකම් සැළසීම හා පුහුණුව සඳහා බෙහෙවින් දියුණුව හා අත්හදා බලන ලද ක්‍රමවේදයන් හා උපකරණ ලබාදීම.

- තරුණයන් අරමුණු කර ගත් ව්‍යවසාය සංවර්ධන වැඩ සටහන් සංවර්ධනය කිරීම.

ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථාන 27 ක් 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එම සංඛ්‍යාව 2007 අවසන් වන විට 37 ක් දක්වා වැඩි විය. එය 2008 ඔක්තෝබර් වන විට මධ්‍යස්ථාන 41 ක් දක්වා වැඩි වූ අතර 2011 වන විට මධ්‍යස්ථාන 45 ක් දක්වා වැඩිකර ගැනීමට හැකිවිය. මෙම ප්‍රජාශක්ති මධ්‍යස්ථානයක් සඳහා අක්කර 2.5 භූමිභාගයක් වෙන් කර ඇති අතර එම භූමිභාගය තුළ නවීනතම තාක්ෂණය සහිත යටිතල පහසුකම් වලින් සමන්විතය. මෙම මධ්‍යස්ථාන 45 පිහිටුවීම සඳහා රුː මිලියන 180 වැය වී ඇත.

**ප්‍රජාශක්ති පුහුණු මධ්‍යස්ථාන තුළ 2011 වර්ෂයේදී පුහුණුව ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව**

| කලාපය | පුහුණු මධ්‍යස්ථාන | 2006 සිට 2011 දෙසැම්ර් දක්වා පුහුණුව ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| බදුල්ල | 10 | 6,492 |
| කෑගල්ල | 4 | 2,439 |
| රත්නපුර | 5 | 1,974 |
| ගාල්ල | 4 | 1,631 |
| මහනුවර | 7 | 4,040 |
| හැටන් | 7 | 5,881 |
| නුවරඑළිය | 8 | 5,454 |
| **එකතුව** | **45** | **27,911** |

### 5.6.1.2 නවශක්ති ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය 2009 වර්ෂයේදී ගරු අමාත්‍ය ආරුමුගම් තොන්ඩමාන් මැතිතුමා විසින් හදුන්වා දෙන ලද්දකි. පසු බෑමකට ලක්වූ ප්‍රදේශවල තරුණ තරුණියන් ආර්ථික වශයෙන් බල ගැන්වීම ඔවුන් තුල ආත්ම ශක්තිය වර්ධනය කර ඔවුන් දිරි ගැන්විම මෙහි මූලික අරමුණ වේ.

මේ යටතේ කිරි ගව පාලනය, කුකුළු පාලනය, එළු පාලනය, වගා කටයුතු හා කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ඔවුන්ට ණය පහසුකම් සැලසීම සිදු කරයි. 2011 වර්ෂය අවසානය දක්වා ප්‍රතිලාභීන් 313 දෙනෙකු සඳහා ණය පහසුකම් ලබා දී ඇත. මහජන බැංකුව හරහා රු. මිලියන 14.1 ක ණය මුදලක් නිකුත් කර ඇත.

**ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාලේඛන**

| කාලය | ප්‍රතිලාභීන් සංඛාව | මූල්‍යාධාර/ ණය වටිනාකම (රු: මිලියන) |
|---|---|---|
| 2009 ජනවාරි | 75 | 2.7 |
| 2009 අගෝස්තු | 140 | 6.0 |
| 2010 අගෝස්තු | 46 | 3.0 |
| 2011 අගෝස්තු | 52 | 2.4 |
| **මුළු ගණන** | **313** | **14.1** |

**2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රතිලාභීන් සංඛ්‍යාව**

| කාණ්ඩය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ණය මුදල (රුපියල්) |
|---|---|---|
| එළවලු වගාව | 34 | 1,565,000 |
| ස්වයං රැකියා | 12 | 525,000 |
| කුකුළු පාලනය | 5 | 215,000 |
| ඇඳුම් මැසීම | 1 | 50,000 |
| **එකතුව** | **52** | **2,355,000** |

ප්‍රජා ශක්ති සංවර්ධන ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කරන ලද තරුණ සමුළුව හා රැළිය 2011 ඔක්තෝම්බර් මස 29 සහ 30 දිනවලදී නෝර්වුඩ් ක්‍රීඩා සංකීර්ණයේදී පවත්වන ලද අතර මේ සඳහා 3000 කට අධික තරුණ තරුණියන් ප්‍රමාණයක් සහභාගී විය.

## 5.6.2 සෞම්‍යමූර්ති තොන්ඩමාන් පදනම විසින් දැනට ක්‍රියාත්මක කරන ව්‍යාපෘතීන්

2005 අංක 19 දරණ පාර්ලිමේන්තු පනත අනුව පහත දැක්වෙන ආයතන 03 සෞම්‍ය මූර්ති තොන්ඩමාන් පදනම වෙත පවරා තිබේ.

- රම්බොඩ පිහිටි තොන්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය
- හැටන් පිහිටි තොන්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය
- නෝර්වුඩ් හි පිහිටි තොන්ඩමාන් ක්‍රීඩා මධ්‍යස්ථානය

### 5.6.2.1 රම්බොඩ පිහිටි තොන්ඩමාන් සංස්කෘතික මධ්‍යස්ථානය

මෙම මධ්‍යස්ථානය අඩු පහසුකම් සහිත ප්‍රජාවගේ සංස්කෘතික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් ආරම්භ කර ඇත. 2009 වර්ෂයේ සිට කර්ණාටක සංගීතය, වීණා වාදනය මෘදංගය හා වයලීන් වාදන පුහුණුව පූර්ණ කාලීන ගුරුභවතුන්ගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ. මේ යටතේ ක්‍රියාත්මක වන සෞන්දර්යය විද්‍යාලය 2011.08.30 වන දින විවෘත කරන ලදී. දැනට මේ යටතේ සිසුන් 62 දෙනෙකු පුහුණුව ලද අතර ඉදිරියේදී වසරකදී සිසුන් 240 පමණ පිරිසක් සඳහා පුහුණුව ලබා දීමට අපේක්ෂිතය.

### 5.6.2.2 තොන්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය "හැටන්"

තොන්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ කළමනාකරණය 2007 මාර්තු මාසයේදී සෞම්‍යමූර්ති තොන්ඩමාන් අනුස්මරණ පදනමට භාරදෙන ලද අතර එහි ප්‍රථම වෘත්තීය පුහුණු කණ්ඩායම පුහුණු කිරීම 2007 ජූලි මාසයේදී ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් මෙම මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් මෙහෙයවීම සඳහා ඉන්දියාවේ විශේෂඥ උපදේශකවරුන් 7 දෙනෙකු ගෙන්වන ලදී. සමහර පාඨමාලාවන් සඳහා දේශීය උපදේශකවරුන් ඔවුන්ට සහාය වන ලදී. දැනට වසරකදී සාමාන්‍යයෙන් සිසුන් 420 ක් පමණ කණ්ඩායම් දෙකක් වශයෙන් මෙම ආයතනය යටතේ පුහුණුව

ලැබිය හැකිය. 2011 වර්ෂය තුලදී සිසුන් 369 දෙනෙකු මේ යටතේ පුහුණුව ලබා ඇත. 2007 ජූලි මාසයේ සිට 2011 දෙසැම්බර් මාසය දක්වා සිසුන් 1786 දෙනෙකු පුහුණුව ලබා ඇත.

**තොන්ඩමාන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - හැටන්**

**2011 වර්ෂයේ පවත්වන ලද පුහුණු පාඨමාලාවන් සහ සහභාගි වූ සිසුන්**

| අංක | පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | මොටර් කාර්මික | 12 |
| 2 | විදුලි කාර්මික | 25 |
| 3 | කාර්මික | 16 |
| 4 | ගුවන් විදුලි හා රූපවාහිනී අලුත්වැඩියාව | 10 |
| 5 | ඇලුමිනියම් ෆැබ්‍රිකේටර් | 27 |
| 6 | ගෘහස්ථ විදුලි කාර්මික | 31 |
| 7 | වඩු කාර්මික | 20 |
| 8 | පරිගණක සහකාර | 40 |
| 9 | ඇඳුම් නිර්මාණය | 55 |
| 10 | යතුරු පැදි කාර්මික | 33 |
| 11 | පෑස්සුම් ශිල්පී | 36 |
| 12 | සැලසුම් නිර්මාණ ශිල්පී | 10 |
| 13 | හෝටල් පාඨමාලා | 5 |
| 14 | (ISMO) (ජුකී) | 33 |
| 16 | AAT | 16 |
| | **එකතුව** | **369** |

## 5.6.2.3 තොන්ඩමාන් ක්‍රීඩා සංකීර්ණය නොර්වුඩ්

2010 දී තොන්ඩමාන් ක්‍රීඩා මධ්‍යස්ථානයේ පිහිටි ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සහ ගොඩනැංවීම සඳහා සෞම්‍යමූර්ති තොන්ඩමාන් පදනම සහ ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය අතර එකඟතාවයක් ඇතිවූ අතර මේ සඳහා වියදම රුපියල් මිලියන 25 කි.

පාපන්දු ක්‍රීඩාංගනය මේ වන විට සම්පූර්ණ කර ඇති අතර පුහුණු නේවාසිකාගාරය, ප්‍රේක්ෂකාගාරය, ක්‍රීඩාංගනය, අත්පන්දු හා දැල්පන්දු ක්‍රීඩාංගන ඉදිරියේදී ඉදිකිරීමට නියමිතය.

## 5.7 වැවිලි මානව සංවර්ධන භාරය

තේ, රබර් සහ පොල් යන වැවිලි කර්මාන්ත අංශයෙහි ජනතාවගේ වතු නිවාස හා අනෙකුත් සමාජ සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් වැවිලි, නිවාස හා සමාජ සුභසාධක භාරය ලෙස 1982 අංක 17 දරණ සමාගම් පනතේ 21 පරිච්ඡේදයට අනුව මෙම ආයතන පිහිටුවන ලද අතර 2002 වර්ෂයේදී වැවිලි මානව සංවර්ධන භාරය ලෙස නම් කරන ලදී. පසුව 2007 අංක 07 දරණ නව සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති විපර්යයකාරක ආයතනයක් වන වැවිලි මානව සංවර්ධන භාරය අමාත්‍යාංශය මගින් වැවිලි ප්‍රජාව උදෙසා කරනු ලබන බොහෝ සංවර්ධන වැඩසටහන් සඳහා සිය දායකත්වය සපයයි.

මේ යටතේ වතු ආශ්‍රිත සංවර්ධනය උදෙසා දායක වන වතු නිවාස වල වහළ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති, ඒකාබද්ධ ග්‍රාමීය ව්‍යාපෘති, වැවිලි අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘති සහ වැවිලි අංශය සංවර්ධනය සඳහා වන විවිධ වැඩසටහන් සඳහා වැවිලි මානව සංවර්ධන භාරය සිය දායකත්වය සපයයි.

### වැවිලි මානව සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන්හි සාරාංශය

| ක්‍රියාකාරකම් | ඒකක ගණන | භෞතික ප්‍රගතිය | | මූල්‍ය ප්‍රගතිය (රු: මි.) |
|---|---|---|---|---|
| | | සම්පූර්ණ කළ සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින සංඛ්‍යාව | |
| නව ජීවන නිවාස ව්‍යාපෘති 1 | 347 | 86 | 261 | 131.19 |
| නව ජීවන නිවාස ව්‍යාපෘති 2 | 425 | 50 | 375 | 9.52 |
| වැසිකිළි ඉදිකිරීම් | 1643 | 1583 | 60 | 42.80 |
| වහළ නැවත සෙවිළි කිරීම 1 | 952 | 952 | - | 34.22 |
| වහළ නැවත සෙවිළි කිරීම 2 | 1339 | 451 | 888 | 33.98 |
| ජල ව්‍යාපෘති | 6 | 5 | 1 | 2.15 |
| වොලිබෝල් අංගන | 31 | 29 | 2 | 21.25 |
| ක්‍රීඩාංගණ | 24 | 19 | 5 | 3.13 |
| කොන්ක්‍රීට් පාරවල් බෝක්කු (මීටර්) | 24,454 | 24,271 | 183 | 68.44 |
| පාලම් | 3 | 2 | 1 | 11.40 |
| විදුහල් වැඩි දියුණු කිරීම | 9 | 8 | 1 | 26.72 |
| විශේෂ වැසිකිළි | 43 | 43 | - | 1.70 |
| ප්‍රජාශාලා | 8 | 8 | - | 5.46 |
| සේවක නිවාස වැඩි දියුණු කිරීම | 8 | 8 | - | 2.29 |
| ආදාහනාගාර ඉදි කිරීම | 1 | - | 1 | |
| කාණු පද්ධති ඉදිකිරීම | 1 | 1 | - | 7.14 |
| ආගමික ස්ථාන සංවර්ධනය | 5 | 5 | - | 9.36 |

### 5.7.1 2011 වර්ෂය තුළ විශේෂ ක්‍රියාකාරකම්

මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව යමින් වතු ආශ්‍රිතව ජීවත් වන ග්‍රාමීය ජනතාව හා නාගරික ජනතාවට ප්‍රතිලාභ අත්වන පරිදි මෙම විශේෂ ව්‍යාපෘතීන් අමාත්‍යංශය විසින් වැව්ලි මානව සංවර්ධන භාරය හරහා ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාකාරකම් අතර යටිතල පහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය සඳහා පහසුකම් සළසන ක්‍රියාකාරකම්, ජල පහසුකම් සැපයීම, සනීපාරක්ෂක පහසුකම් සැපයීම විශේෂ ස්ථානයක් ගන්නා ලදී. තවද ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කොන්ක්‍රීට් කිරීම, ආගමික අංශයට සම්බන්ධ විවිධ ක්‍රියාකාරකම් ආදිය ද ප්‍රමුඛව ඉටු කරනු ලැබේ.

මේ අනුව දැනට මහනුවර, හැටන්, නුවරඑළිය, බදුල්ල, රත්නපුර සහ කෑගල්ල යන කලාප සඳහා මේ යටතේ ව්‍යාපෘතී ක්‍රියාත්මක කරන ලදී.